# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/8 - 2016 මාර්තු මස 29 වැනි අඟහරුවාදා - 2016.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2014 ඔක්තෝබර් මස 20 වැනි දින අංක 1885/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමයක් ලෙස සළකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වන තීරයේ ''පීඨ'' යන ශීර්ෂය යටතේ දක්වෙන ''සම සෞඛ්‍ය විද්‍යා පීඨය'' යන අයිතමයට අනුරූපීව එහි II වන තීරයේ ''අධ්‍යයන අංශ'' යන ශීර්ෂය යටතේ දක්වෙන 5 වන අයිතමයට ඉක්බිතිව ම, පහත දක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''6. මූලික විද්‍යා අංශය.''

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

04 - 548

1A - PG 2901 — 507 (2016/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*